**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2015**

-----------------------------------------------------

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් ප්‍රත්‍යාගණනයේදී අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද සභාව විසින් වත්කම් ප්‍රත්‍යාගණනයේදී දේපල, පිරියත හා උපකරණවලින් කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ආ) වත්කම් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක කළ දිනය, ස්වාධීන තක්සේරුකරුවෙකු යොදා ගත්තේද යන වග, වත්කම්වල සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේදී ව්‍යවහාර කළ ක්‍රම හා වැදගත් උපකල්පනයන් හෙළිදරව් කළ යුතු වුවද ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එපරිදි හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඇ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන වත්කම් එහි ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්වල හෙළිදරව් කළ යුතු වුවත් පිරිවැය රු.15,445,186 ක්වූ වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය ප්‍රකාරව 2013 සහ 2014 වර්ෂ වෙනුවෙන් පිළියෙල කළ "රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යා හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුල කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව" පනතේ විධිවිධාන අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.889,417 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 542,816 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,432,233 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 3,681,647 කින් අඩු වුවද, වියදම රු.5,113,880 කින් අඩුවීම නිසා ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් ඇති වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සිට ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ අඛණ්ඩ ඌනතාවය 2015 වර්ෂයේදී අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2011 වර්ෂයේදී රු.7,460,849 ක්වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී එය රු.15,946,234 ක් දක්වා එනම් සියයට 114 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 1 වන කොටසේ 5 වන වගන්තිය ප්‍රකාරව, විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම, ආර්ථික වර්ධනය ශක්තිමත් කරලීම, සෞඛ්‍ය, පෝෂණය හා දිළිඳුකම තුරන් කිරීම, අධ්‍යාපන, පුහුණු කිරීම් හා පර්යේෂණ සම්බන්ධයෙන් අවශ්‍ය මිනිස් සහ වෙනත් සම්පත් සංවර්ධනයට විද්‍යා හා තාක්ෂණය යොදා ගැනීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල අරමුදල් වෙන් කිරීමට අදාලව ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාව තුල විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මේලනය අවුරුදු දෙකකට වරක් කැඳවීම හා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ සාකච්ජා කිරීමට මණ්ඩපයක් සැලසීම හා ඒ පිළිබඳව අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සභාවේ කාර්යයන් වේ.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යා හා තාක්ෂණ ආයතන හඳුනාගෙන සමාලෝචන ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මේලනය සඳහා 2014 වර්ෂයේදී රු.2,995,861 ක් වැයකර 7 වන ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව පවත්වා තිබු නමුත් එම සමුළුවේදී ක්ෂේත්‍ර 10 කට අදාළව විද්‍යා හා තාක්ෂණ දියුණුවක් ඇති කිරීමට එකඟතාවයකට පැමිණ තිබුණද එම ක්‍රියාවලිය අක්‍රීය වී තිබුණි.

### 4.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.763,477 ක්වූ ආරක්ෂක සේවාව ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 18 ක් හා තථ්‍ය 15 ක් වීමෙන් තනතුරු 03 ක පුරප්පාඩු ඇති වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුරප්පාඩු වී තිබුණු විද්‍යාඥ තනතුරු 02ක් හා පරිපාලන නිලධාරී තනතුර සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යයන කණ්ඩායම් ක්‍රියාකාරකම් 03 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් ක්‍රියාකාරකම් 2 ක් ආරම්භ කර නොතිබුණු අතර ආරම්භ කළ ක්‍රියාකාරකමේ අවසන් වාර්තාව පිළියෙල කර ඇතත් වාර්තා නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. ආයතනයේ කලක සිට පවතින විද්‍යාත්මක කාර්ය මණ්ඩල හිඟතාවය නිසා මෙම

ක්‍රියාකාරකම් ඉටු කිරීමට නොහැකි වූ බව කොමිෂන් සභාවේ සභාපති විසින් විගණනයට වාර්තා කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (1) (අ) රෙගුලාසිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික විගණන සැලැස්මක් 2015 සැප්තැම්බර් 02 දින අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී අයිතමයන් 21 ක සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝජනය කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදනය | විධිමත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව සේවා ලබා ගැනීම. |
| (ආ) අයවැය පාලනය | නිසියාකාරව ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | විද්‍යාත්මක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |